සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

| ශ්‍රේණිය / தரம் / Grade | ඉතිහාසය - I | කාලය / நேரம் / Time |
|---|---|---|
| 11 ශ්‍රේණිය | | පැය 1 යි |

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ....................

**සැලකිය යුතුයි :**

- මෙම කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න
- ප්‍රශ්න අංක 01 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නයට (1) (2) (3) (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා පිළිතුරු පත්‍රයේ සඳහන් කරන්න

1) ශ්‍රී ලංකාවේ ගම්පොළ රාජ්‍ය සමයේ සිට කොට්ටේ රාජ්‍ය සමය දක්වා ශාසන ඉතිහාසය හැදෑරීම සඳහා යොදාගත හැකි සාහිත්‍ය මූලාශ්‍රයක් වන්නේ

1. රාජාවලිය යි  2. නිකාය සංග්‍රහය යි  3. පූජාවලිය යි  4. ධාතුවංශය යි

2) අතීතයේ ප්‍රාදේශිය මායිම් දැක්වීම සඳහා යොදාගන්නා ලද සංකේතයක් වන්නේ

1. සඳකඩ පහන යි  2. මුරගල යි  3. දුන්න යි  4. කඩුව යි

3) ගංගාවක පිටාර නිම්නයෙන් පිටත බිහි වූ මුල් ඓතිහාසික යුගයේ ජනාවසවල ජීවත් වූ ජනතාවගේ ප්‍රධාන යැපීම් ක්‍රමය වූයේ කුමක් ද?

1. හේන් වගාව  2. වී වගාව  3. ගෙවතු වගාව  4. දඩයම

4) පූර්ව රාජ්‍ය සමයේ ලියන ලද සෙල් ලිපිවල කුඩා ප්‍රදේශවල බලය පවත්වාගෙන ගිය වත්පොහොසත්කම් ඇති ප්‍රභූවරු හැඳින් වූ නම කුමක් ද?

1. දසගම් ඇත්තන්  2. ගමික  3. වපිහමික  4. පරුමක

5) බුද්ධඝෝෂ හිමියන් විසින් රචනා කරන ලද සමන්තපාසාදිකාව නම් කෘතියේ සඳහන් කරුණක් වන්නේ

1. සුමන නම් ගමිකයා භික්ෂූන් වහන්සේලා ට ගල් ගුහාවක් පිරිසිදු කොට පූජා කල බවයි
2. ගමේ විවිධ ආරවුල් විසදීම ගමික සතු කාර්යයක් බවයි
3. ගමිකයන් පත්කර ගන්නා ලද්දේ ගෘහපතියන් අතරින්ම බවයි
4. ගමිකයින් අන් අයට පවා උදවු කිරීම ට තරම් ධනවත් පිරිසක් වූ බවයි

- පහත A සිට E දක්වා ප්‍රකාශ කියවා 06 සහ 07 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න

A. ප්‍රාදේශිය පාලකයන් කිහිප දෙනෙක් පරාජය කොට රාජ්‍යත්වයට පත්වීම
B. පරුමක වරුන්ගේ සහය ලබාගෙන විමධ්‍යගතව තිබූ දේශපාලන බලය මධ්‍යගත කිරීම
C. ශ්‍රී මහා බෝධි රෝපණ අවස්ථාවෙ දී කාවරගාම සහ චන්දන ග්‍රාම ක්ෂත්‍රියන්ට ආරාධනා කිරීම
D. දසවන රාජ වර්ෂයේ දී දිවයිනේ ග්‍රාම සීමා නියම කිරීම
E. පංච කකුධ භාණ්ඩ භාවිත කොට නැවත අභිෂේකය ලැබීම

6) පණ්ඩුකාභය රජු හා සම්බන්ධ තොරතුරු දැක්වෙන ප්‍රකාශ ඇතුලත් පිළිතුර කුමක් ද

1. A - C  2. A - D  3. A - B  4. D - E

7) දේවානම්පියතිස්ස රජු හා සම්බන්ධ තොරතුරු දැක්වෙන ප්‍රකාශ ඇතුලත් පිළිතුර කුමක් ද?

1. A - D  2. B - E  3. C - D  4. C - E

8) ක්‍රිස්තු වර්ෂ නමවන සියවසේ දී පමණ ලියන ලද සෙල්ලිපි වල "සභාව" යන පදයෙන් අදහස් කර ඇත්තේ

1. ව්‍යවස්ථාදායකය යි  2. විධායකය යි  3. අධිකරණය යි  4. රාජ සභාව යි



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

9) පහත I තීරුවේ දැක්වෙන තොරතුරු II තීරුවේ දැක්වෙන තොරතුරු සමඟ ගලපා නිවැරදි පිළිතුර තෝරන්න

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. වේගිරිය සෙල් ලිපිය | A. යකඩ කර්මාන්තය |
| 2. වෙහෙරකෙම සෙල් ලිපිය | B. ඇත්දල කර්මාන්තය |
| 3. මුතුගල්ල සෙල් ලිපිය | C. රන් කර්මාන්තය |
| 4. මණ්ඩගල සෙල් ලිපිය | D. රෙදි විවීමේ කර්මාන්තය |

1. ACBD  2. BACD  3. CBAD  4. BDAC

10) පළමුවන උපතිස්ස රජු විසින් ගැබිනි මවුවරුන්ගේ අවශ්‍යතා සඳහා ඉදිකල මාතෘ නිවාස හඳුන්වන නම කුමක් ද?
1. පසවත්තිනාමසාලා  2. සිවිකාසාලා  3. සොත්ථිසාලා  4. වෙජ්ජසාලා

11) අතීත ශ්‍රී ලංකාවේ දියුණු වෛද්‍ය තාක්ෂණයක් පැවති බව සනාථ කරගත හැකි ප්‍රබලම සාක්ෂියක් වන්නේ
1. වෛද්‍යවරුන් ලෙස ප්‍රසිද්ධ වූ පාලකයන් පිළිබඳව වංශ කතාවල සඳහන් වීම යි
2. බෙහෙත් ඔරු සහිත රෝහල් ගොඩනැගිලි වල නටබුන් හමුවීම යි
3. පුරාවිද්‍යාත්මක කැනීම් වලින් ශල්‍ය වෛද්‍ය උපකරණ හමුවීම යි
4. වෛද්‍ය ශාස්ත්‍රය ගැන ලියවුනු පැරණි වෙදපොත් හා පුස්කොල පොත් හමුවීම යි

12) පූර්ව ඓතිහාසික යුගය ට අයත් කාලරක්ත මැටි බඳුන් වල ඇතුලත කළු පැහැයක් ගැනිමට බලපෑ හේතුව වන්නේ
1. දහයියා පුරවා තිබීම නිසා බඳුන තුලට ඔක්සිජන් වායුව අඩුවෙන් ලැබීම යි
2. නියමිත උෂ්ණත්වය ට බඳුන පුලුස්සා නොගැනීම යි
3. බඳුන උඩුනේ යටිකුරු කොට නවා තැබීම නිසා වාතය ගමන් නොකිරීම යි
4. බඳුන නිපදවීම ට යොදාගත් මැටි නියමිත ලෙස පදම් නොකිරීම යි

13) වැවේ ඇති ජලය මුදහැරීම සඳහා සොරොව්වට සම්බන්ධ කර තිබූ ගල් කුළුණ හඳුන්වන ලද්දේ කුමන නමකින් ද?
1. මොහොල් නගා  2. දියකැට පහන  3. බිසෝ කොටුව  4. කලිඟු බැම්ම

14) සීගිරි ජල උද්‍යානයේ කාණු පද්ධතිය දඟරාකාරව සකස් කිරීම තුලින් එහි නිමර්‍ණ ශිල්පියා ඉටුකර ගැනිමට බලාපොරොත්තු වූ අරමුණ වන්නේ
1. කාණු පද්ධතියේ අලංකාරය වැඩි කිරීම යි
2. රොන්මඩ ස්වාභාවික ගුරුත්ව බලයෙන් පහළට කිඳා බැස්සවීම යි
3. කාණු පතුලේ තැන්පත්වන රොන්මඩ ඉවත් කිරීම පහසු කිරීම යි
4. ජල මල් වල ක්‍රියාකාරිත්වය වේගවත් කිරීම යි

15) අතීතයේ මෙරට විසූ රන්කරුවන්ගේ ආභරණ සැකසීමේ තාක්ෂණයේ විශිෂ්ටත්වය පෙන්නුම් කරන ප්‍රබලම සාක්ෂිය වන්නේ
1. අභයගිරි කැනීම් වලින් හමු වූ රන් ආභරණ සමූහය යි
2. සීගිරි කැනීම් වලින් හමු වූ කුණ්ඩලාභරණ යි
3. මාගම නගරයෙන් හමු වූ මැණික් හා අඩර් මැණික් වලින් නිම කල පබළු හා මුදු ආදිය යි
4. ජේතවන කැනීම් වලින් හමු වූ වී ඇටයක ප්‍රමාණයේ රන් තැල්ලක කොටස යි

16) දිග මැනීම සඳහා අතීත ජනතාව විසින් භාවිත කරන ලද කුඩාම ඒකකය කුමක්ද
1. පරමාණුව  2. ආංගුලය  3. වියත  4. රථරේණු

17) ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද පැරණිම කාසිය වන්නේ,
1. හස් එබු කහපණ කාසිය යි
2. තඹ මස්ස යි
2. අක නම් රන් කාසිය යි
4. අලියා සහ ස්වස්තික කාසිය යි

18) අතීත කාන්තාවන් සමාජය තුල විශේෂ ගෞරවාදරයට පත් වීම කෙරෙහි බල පෑ ප්‍රධානම සාධකය වූයේ
1. සූප ශාස්ත්‍රයෙහි නිපුනතා දැක් වූ බැවිනි
2. රාජ්‍ය පාලන කටයුතු සඳහා සහභාගී වූ බැවිනි
3. මවක ලෙස ඔවුන් විශාල වගකීමක් ඉසිලූ බැවිනි
4. ශාසනික කටයුතු වලදී තම පෞද්ගලික දේපල පරිත්‍යාග කල බැවිනි

19) ශ්‍රී ලංකාවේ පළමු නාගරිකරණය ට අයත් වන පැරණි ම නගර දෙක වන්නේ
1. අනුරාධපුරය හා මාගම යි
2. අනුරාධපුරය හා පොළොන්නරුව යි
3. මාගම හා පොළොන්නරුව යි
4. අනුරාධපුරය හා සීගිරිය යි



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Department of Education, Southern Province

28689

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade : 11 ශ්‍රේණිය | ඉතිහාසය - II | කාලය / நேரம் / Time : පැය 3 යි |

නම / பெயர் / Name .................................................... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ...............................

අමතර කියවීම් කාලය: විනාඩි 10යි

සැලකිය යුතුයි :

- I කොටසේ ප්‍රශ්න අංක 01 අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

1) අ) පහත I යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද II යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න

i. දැදුරු ඔය, මැණික් ගඟ, පදවිය වැව, පොම්පරිප්පු, සීගිරිය, සොංකඩගල, මිණිපේ අමුණ, දේවනගර, ගෝකණ්ණතිත්ථ, නාගදීපය, මිහින්තලේ කන්ද, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ (1 X 12 - ලකුණු 12)


ii. රෝමය, පෘතුගාලය, ජාවා දූපත, මදුරාසිය, කොරියන් අර්ධද්වීපය, රතු මුහුද (1 X 06 - ලකුණු 06)

ආ) පහත A, B, C,හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරුවලට අදාල පිළිතුර අනුපිළිවලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න

A. වර්ෂ 1232 දී දඹදෙණි රාජධානිය ආරම්භ කල පාලකයා
B. ඩිවිනා කොම්ඩියා නම් කාව්‍ය ග්‍රන්ථය රචනා කල මානවවාදී කතුවරයා
C. වීදිය බණ්ඩාර සමඟ විවාහ වී සිටි හත්වන බුවනෙකබාහු රජුගේ දියණිය
D. 1953 හර්තාල් ව්‍යාපාරය නිසා තනතුරෙන් ඉල්ලා අස් වූ අගමැතිවරයා (1 X 04 - ලකුණු 04)

ඉ) A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්න වලට අදාල පිළිතුර අනුපිළිවලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න


A රූපය



I. යාබද A රූපයේ දැක්වෙන්නේ කුමක්ද ?
II. මේවා හමුවූයේ කුමන ස්ථානයකින්ද
III. එම ස්ථානය ඉදිකල පාලකයා කවුද?
IV. ඔහු පාලනය කල රාජධානිය නම් කරන්න?

(1 X 04 - ලකුණු 04)

B රූපය



I. යාබද B රූපය හඳුනාගෙන නම් කරන්න
II. මොහු නියෝජනය කරන ලද දේශපාලන පක්ෂය කුමක් ද?
III. මොහු විසින්ක්‍රියාත්මක කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කුමක් ද?
IV. එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඔහුට හිමි වූ තනතුර කුමක් ද?

(1 X 04 - ලකුණු 04)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

## II කොටස

02) i. ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ පහත රට වියළි කලාපීය ගල්ලෙන් වාසස්ථාන තුනක් නම් කරන්න (ලකුණු 03)

ii. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තිය ට බලපෑ ප්‍රධාන සාධක හතරක් ලියන්න (ලකුණු 04)

iii. ප්‍රාග් ඓතිහාසික යුගයේ ජීවත් වූ මානවයාගේ අභිචාර විධි කරුණු දෙකක් මගින් විස්තර කරන්න (ලකුණු 05)

iv. පූර්ව ඓතිහාසික යුගයේ ජීවත් වූ මානවයාගේ ජීවන රටාව කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න (ලකුණු 06)

03) i. දුටුගැමුණු රජුගේ සේනාවේ සිටි, මුල් කාලයේ දී පරුමකවරුන් ලෙස කටයුතු කොට පසුව සේනාධිපති තනතුරු ලැබූ පුද්ගලයින් තිදෙනෙක් නම් කරන්න (ලකුණු 03)

ii. පහත සඳහන් රාජ්‍යත්ව සංකල්ප වලින් හඳුන්වන ලද පාලකයන් පහත වරහන් තුලින් තෝරා ලියන්න

A - චක්‍රවර්ති රාජ B - දේවත්ව රාජ

C - නරේශ්වර රාජ D - අලකපය මහරජ

**(පලමුවන කාශ්‍යප, කුටකණ්ණඅභය, දුටුගැමුණු, නිශ්ශංකමල්ල, මහසෙන්)** (ලකුණු 04)

iii. A- ලම්භකර්ණ රාජ වංශයේ ආරම්භක පාලකයා නම් කරන්න (ලකුණු 01)

B- ඔබ විසින් සඳහන් කල පාලකයා රටේ ආර්ථික දියුණුව සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග දෙකක් පැහැදිලි කරන්න (ලකුණු 04)

iv. අතීත ශ්‍රී ලංකාවේ බුදු දහම ට අමතරව තවත් ආගම් ක්‍රියාත්මක වූ බව සාධක තුනක් මගින් පැහැදිලි කරන්න (ලකුණු 06)

04) i. පුරාණ කාලයේ දී බෞද්ධ විහාරාමවල විසූ භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා ඉදිකල පොකුණු තුනක් නම් කරන්න (ලකුණු 03)

ii. ශ්‍රී ලංකාවේ අතීත ජන සමාජයේ ඉහළ මට්ටමේ ප්‍රභූන් ලෙස සැලකූ පුද්ගල කණ්ඩායම් හතර නම් කරන්න. (ලකුණු 04)

iii. පුරාණ කාලයේ දී මෙරට පැවති යකඩ නිස්සාරණ තාක්ෂණය පිළිබඳ කරුණු දෙකක් මගින් විස්තර කරන්න. (ලකුණු 05)

iv. කෝට්ටේ රාජධානි සමයේ අධ්‍යාපනය සහ සාහිත්‍යයේ ඇතිවූ දියුණුව කරුණු තුනක් යටතේ විස්තර කරන්න (ලකුණු 06)

05) i. A - යාපනය රාජධානිය පාලනය කල රජ පරපුර හැඳින් වූ නම

B - කෝට්ටේ රාජධානිය තැගි ඔප්පුවකින් පෘතුගීසින්ට පැවරූ පාලකයා

C - ත්‍රිසිංහලාධීශ්වර යන අන්වර්ථ නාමය භාවිත කල උඩරට පාලකයා නම් කරන්න (ලකුණු 03)

ii. පහත A, B, C, හා D යටතේ දැක්වෙන ප්‍රකාශ වලට අදාල පිළිතුරු වරහන් තුලින් තෝරා ලියන්න

A - දළදා මාළිගාවේ කටයුතු භාරවසිටි නිළධාරියා

B - උඩරට ප්‍රාදේශීය පාලනය භාරව සිටි පහළම නිළධාරියා

C - රාජ්‍ය මුලුතැන්ගෙය භාරව කටයුතු කල පුද්ගලයා

D - ප්‍රවාහන කටයුතු භාරව කටයුතු කල පුද්ගලයා

(බත් වඩන නිළමේ ,දියවඩන නිලමේ, මඩිගේ ලේකම් ,මහ ලේකම්, රටේ රාල, විදානේ ) (ලකුණු 04)

iii. A - දෙවන රාජසිංහ රජු මුහුණ දුන් අභියෝග දෙකක් ලියන්න (ලකුණු 02)

B - ඉන් එක් අභියෝගයක් ජයගැනිම සඳහා ඔහු විසින් ගන්නා ලද ක්‍රියාමාර්ගය විස්තර කරන්න (ලකුණු 03)

iv. මහනුවර රාජධානි සමයේ ආර්ථික රටාව කරුණු තුනක් මගින් පැහැදිලි කරන්න (ලකුණු 06)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

06) i. ලන්දේසින් මෙරට මුහුදු බඩ ප්‍රදේශ පාලනය කරන සමයේ දී උඩරට රාජධානිය ට පැමිණි බ්‍රිතාන්‍ය දූතයන් තිදෙනා නම් කරන්න (ලකුණු 03)

ii. පහත A,B,C, හා D යටතේ ඇති ප්‍රකාශ සඳහා නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න

A. බ්‍රිතාන්‍ය පාලනය යටතේ මෙරට ට පත්ව ආ ප්‍රථම ආණ්ඩුකාරවරයා

B. ප්‍රංශය විසින් ඕලන්දය ආක්‍රමණය කිරීම නිසා බ්‍රිතාන්‍ය රැකවරණය පැතූ ඕලන්ද පාලකයා

C. උඩරට යටත් කරගැනීමේ දී විශාල මෙහෙයක් ඉටුකල බ්‍රිතාන්‍ය නිලධාරියා

D. දෙවන නිදහස් සටන අවස්ථාවේදී උඩරට රජු ලෙස අභිෂේක ලැබූ පුද්ගලයා (ලකුණු 04)

(රොබට් බ්‍රවුන්රිග්, දොරේසාමි, ගොන්ගාලේගොඩ බණ්ඩා, ජෝන් ඩොයිලි)

iii. A - වර්ෂ 1797 මුහුදු බඩ ප්‍රදේශවල ජනතාව ඉංග්‍රීසි වෙළඳ සමාගම ට විරුද්ධව කැරලි ගැසීමට බලපෑ ප්‍රධාන හේතුව කුමක් ද? (ලකුණු 01)

B - එම කැරල්ල පිළිබඳව සොයා බැලීමට පත් කල මියුරන් කොමිසමේ නිර්දේශ දෙකක් විස්තර කරන්න (ලකුණු 04)

iv. 1848 නිදහස් සටන ඇති වීම කෙරෙහි කෝල්බෲක් ප්‍රතිසංස්කරණ වලින් ඇති වූ බලපෑම කරුණු දෙකක් යටතේ විස්තර කරන්න (ලකුණු 06)

07) i. බ්‍රිතාන්‍යයන් යටතේ මෙරට ක්‍රියාත්මක වූ මිෂනාරි සංවිධාන තුනක් නම් කරන්න (ලකුණු 03)

ii. පහත A, B, C හා D යටතේ දක්වා ඇති ප්‍රකාශ වලට අදාල පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න

A. පානදුරාවාදය සඳහා මූලිකත්වය ගත් ස්වාමින්වහන්සේ

B. දුවිඩ සිසුන් ට ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා දීම සඳහා යාපනයේ ඉදිකල පාසල

C. බෞද්ධ පුනරුද සමයේ මධ්‍යසාර භාවිතය වැලැක්වීම සඳහා ගෙන ගිය වැඩ සටහන

D. ඊජිප්තුවේ සිට පැමිණ ඉස්ලාම් පුනරුද ව්‍යාපාරය ට සම්බන්ධ වූ පුද්ගලයා (ලකුණු 04)

(ඔරබි පාෂා, පරමේෂ්වර විද්‍යාලය, හික්කඩුවේ සුමංගල හිමි, සූරියමල් ව්‍යාපාරය, මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි, සිවන්ගල විද්‍යාලය, සිද්දි ලෙබ්බේ, අමද්‍යප ව්‍යාපාරය)

iii. බ්‍රිතාන්‍ය පාලනය නිසා මෙරට ඇති වූ සමාජ වෙනස්කම් දෙකක් පැහැදිලි කරන්න (ලකුණු 05)

iv. 1948 නිදහස ලැබීමෙන් පසු ව්‍යාපාරික කෘෂිකාර්මික ක්ෂෙත්‍රයේ ඇති වූ වෙනස්කම් තුනක් විස්තර කරන්න. (ලකුණු 06)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

# III කොටස

08) i. විසිවන සියවස ආරම්භ වන විට කාර්මික විප්ලවය ව්‍යාප්ත වූ ආසියාතික රටවල් තුනක් නම් කරන්න (ලකුණු 03)

ii. කාර්මික විප්ලවය ට සමගාමී ව කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ ඇති වූ වර්ධනය සඳහා බල පෑ හේතු දෙකක් නම් කරන්න (ලකුණු 04)

iii. කාර්මික විප්ලවය නිසා පේෂ කර්මාන්තයේ ඇති වූ වෙනස්කම් දෙකක් පැහැදිලි කරන්න (ලකුණු 05)

iv. කාර්මික විප්ලවයේ ප්‍රතිඵලක් ලෙස ලෝක ආර්ථික ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස් කම් තුනක් පැහැදිලි කරන්න (ලකුණු 06)

09) i. ඇමරිකාව තුල ජනපද පිහිටුවන ලද යුරෝපා ජාතීන් තුනක් (**බ්‍රිතාන්‍යයන් හැර**) නම් කරන්න (ලකුණු 03)

ii. A - පලමුවන ලෝක සංග්‍රාමයට සම්බන්ධ වූ මිත්‍ර පිලේ රටවල් දෙකක් හා

B - දෙවන ලෝක සංග්‍රාමයට සම්බන්ධ වූ අක්ෂ පිලේ රටවල් දෙකක් නම් කරන්න (ලකුණු 04)

iii. A - විසිවන සියවස ආරම්භ වනවිට රුසියාව පාලනය කරන ලද රජ පරපුර හැඳින් වූ නම කුමක් ද? ( ලකුණු 01)

B - රුසියන් විප්ලවයට බල පෑ හේතු දෙකක් විස්තර කරන්න (ලකුණු 04)

iv. එක්සත් ජාතීන්ගේ සංවිධානය ලෝක සාමය රැකීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග තුනක් පැහැදිලි කරන්න (ලකුණු 06)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

20) දඹදෙණි රාජධානියේ දෙවන පරාක්‍රමබාහු රජු විසින් රචනා කරන ලද ග්‍රන්ථය කුමක් ද?
1. පූජාවලිය 2. කව්සිළුමිණ 3. සද්ධර්මරත්නාවලිය 4. සිදත් සඟරාව

21) සියම් දේශයෙන් භික්ෂූන් වහන්සේලා වැඩම කරවා උපසම්පදාව ඇති කිරීම තුලින් මෙරට සියම් නිකාය ආරම්භ කල උඩරට පාලකයා කවුරුන් ද?
1. පළමුවන විමලධර්මසූරිය රජු 2. දෙවන විමලධර්මසූරිය රජු
3. ශ්‍රී විජය රාජසිංහ රජු 4. කීර්ති ශ්‍රී රාජසිංහ රජු

22) පුනරුද සමයේ චිත්‍ර කලාවේ පුළුල් වෙනසක් ඇති කල ඉතාලියේ පිහිටි නගරය කුමක් ද?
1. ජිනෝවා 2. වැනිසිය 3. ෆ්ලෝරන්ස් 4. රෝමය

23) පෘතුගීසින් මෙරට ට පැමිණෙන විට කෝට්ටේ රාජධානියේ පාලකයා වූයේ ?
1. හය වන බුවනෙකබාහු රජු ය 2. හය වන විජයබාහු රජු ය
3. අට වන වීර පරාක්‍රමබාහු රජු ය 4. හත් වන බුවනෙකබාහු රජු ය

❖ පහත **A** සිට **E** දක්වා ඇති තොරතුරු ඇසුරෙන් **24, 25** ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

A - ජේම්ස් හාග්‍රීවුස් ජෙනි යන්ත්‍රය
B - ජෝර්ජ් ස්ටීවන්සන් දුම්රිය එන්ජිම
C - හෙන්රි කෝට් රෝලර් යන්ත්‍රය
D - ජේම්ස් වොට් වාෂ්ප එන්ජිම
E - දකුණු අප්‍රිකාව ගුවානෝ පොහොර

24) පේෂ කර්මාන්තයේ සහ ගල් අඟුරු කර්මාන්තයේ වර්ධනය ට බලපෑ සොයාගැනීම් සම්බන්ධ තොරතුරු ඇතුළත් ප්‍රකාශ යුගලය කුමක්ද?
1. A හා D 2. B හා D 3. C හා E 4. D හා E

25) යකඩ හා වානේ කර්මාන්තයේ සහ කෘෂිකර්මාන්තයේ වර්ධනයට බලපෑ සොයාගැනීම් සම්බන්ධ තොරතුරු ඇතුලත් ප්‍රකාශ යුගලය කුමක් ද?
1. A හා B 2. B හා E 3. C හා D 4. C හා E

26) ඉංග්‍රීසි විසින් ශ්‍රී ලංකාව ඇතුළු පෙරදිග ප්‍රදේශවල බලය ව්‍යාප්ත කිරීමේ දී පෙරදිග වෙළඳ මධ්‍යස්ථානය පිහිටුවා ගන්නා ලද්දේ කුමන ස්ථානයක ද?
1. මද්‍රාසිය 2. කල්කටාව 3. බොම්බාය 4. ගෝව

27) 1848 දෙවන නිදහස් සටන ට බලපෑ අසන්නතම හේතුව කුමක් ද?
1. ප්‍රාදේශීය පරිපාලන කටයුතු අකාර්යක්ෂම වීම 2. කැමරන් විසින් හඳුන්වාදුන් නව අධිකරණ ප්‍රතිසංස්කරණ
3. ටොරින්ටන් ආණ්ඩුකාරවරයාගේ නව බදු ප්‍රතිපත්තිය 4. රජයේ ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තිය

28) බ්‍රිතාන්‍ය පාලන සමය තුල යාපනය ප්‍රදේශයේ ක්‍රිස්තියානි ආගම පැතිරවීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරන ලද්දේ
1. ලන්ඩන් මිෂනාරි සමාගම යි 2. ඇමරිකන් මිෂනාරි සමාගම යි
3. චචර් මිෂනාරි සමාගම යි 4. බැප්ටිස්ට් මිෂනාරි සමාගම යි

29) ජාතික පුනරුදය සමයේ දී බෞද්ධ,හින්දු හා ඉස්ලාම් ආගමික නායකයන් විසින් ජනතාව දැනුවත් කිරීම සඳහා යොදාගන්නා ලද පොදු ක්‍රමවේදය කුමක් ද?
1. පුවත් පත් සහ සඟරා මුද්‍රණය කොට ජනතාව අතර බෙදා හැරීම
2. ආගමික පූජනීය ස්ථාන රැක ගැනීම සඳහා මැදිහත් වීම
3. වාද විවාද පැවැත්වීම
4. ගමෙන් ගමට ගොස් ජනතාවට දේශන පැවැත්වීම

30) 1833 කෝල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ තුලින් ආණ්ඩුකාරවරයාගේ බලතල අඩුකිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ගය වන්නේ
1. උඩරට හා පහතරට එකාබද්ධ කිරීම යි 2. දිවයින පළාත් පහකට බෙදීම යි
3. රජය සතුව තිබූ වෙළඳ ඒකාධිකාරය අහෝසි කිරීම යි 4. ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම යි

31) 1931ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ශ්‍රී ලංකික ජනතාව ලැබූ විශාලතම ජයග්‍රහණය වූයේ
1. විධායක කාරක සභා සහ යටතේ ලාංකික අමාත්‍යවරු බිහිවීම යි 2. සර්වජන ඡන්ද බලය ලැබීම යි
3. ජනවාර්ගික නියෝජන ක්‍රමය අහෝසි වීම යි 4. පළාත් බද නියෝජන ක්‍රමය හඳුන්වාදීම යි

32) බ්‍රිතාන්‍ය පාලනය නිසා ශ්‍රී ලාංකිකයන් ට මුහුණ පැමට සිදුවූ අහිතකර බලපෑමක් වන්නේ
1. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය මෙරට ට ලැබීම යි. 2. අපනයන වැවිලි බෝග හඳුන්වාදීම යි.
3. බටහිර සංස්කෘතිය රට පුරා පැතිර යාම යි. 4. කාර්මික විප්ලවයේ බලපෑම මෙරට ට ලැබීම යි.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

❖ පහත **A** සිට **D** දක්වා දී ඇති තොරතුරු ඇසුරෙන් **33** හා **34** ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

A. ප්‍රථම වරට මූලික මිනිස් අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත කර තිබීම
B. පූර්ණ විධායක බලතල සහිත ජනාධිපති තනතුරක් ස්ථාපිත කිරීම
C. පාර්ලිමේන්තුව ට නියෝජිතයන් තේරීම සඳහා සමානුපාතික නියෝජන ක්‍රමය භාවිත කිරීම
D. ශ්‍රී ලංකාව ඒකීය ජනරජයක් බව පිළිගැනීම

33) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධ තොරතුරු අඩංගු පිළිතුර කුමක් ද?

1. A හා B
2. B හා D
3. C හා D
4. A හා D

34) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධ තොරතුරු අඩංගු පිළිතුර කුමක් ද

1 A හා B
2. B හා c
3. C හා D
4. A හා D

❖ පහත **A , B , C** හා **D** යටතේ ප්‍රකාශ යුගලයක් බැගින් දක්වා ඇත. මෙහි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවය පරිකෂා කර **35 ; 36 ,** හා **37** යන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

A. රුසියානු විප්ලවය
සමාජවාදී පාලන ක්‍රමයක් බිහිවීම

B. ජාතීන්ගේ සංගමය
ඇමරිකා එක්සත් ජනපදය

C. බෙනිටෝ මුසෝලිනි
එස් එස් හමුදාව

D. ආර්ථික හා සමාජීය මණ්ඩලය
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල

35) පලමුවැන්න අසාර්ථක වීමට දෙවැන්න හේතු වූ බව දක්වන පද යුගලය කුමක් ද?

1. A
2. B
3. C
4. D

36) දෙවැන්න බිහිවූයේ පළමුවැන්නේ ප්‍රතිඵලයක් ලෙස බව දක්වන පද යුගලය කුමක් ද?

1. A
2. B
3. C
4. D

37) පළමුවැන්න සහ දෙවැන්න අතර සම්බන්ධතාවයක් නොමැති පද යුගලය කුමක් ද?

1. A
2. B
3. C
4. D

❖ පහත **A** හා **B** ප්‍රකාශ අතුරින් **38** වන ප්‍රශ්නයට පිළිතුරු සපයන්න

A. නියෝජිතයන් නොමැතිනම් බදුත් නැත
B. ටෙනිස් පිටියේ දිවුරුම

38) ඇමෙරිකන් නිදහස් සටන සම්බන්ධයෙන්

1. A හා B සත්‍ය වේ
2. A සත්‍ය වන අතර B අසත්‍ය වේ
3. A හා B අසත්‍ය වේ
4. B සත්‍ය වන අතර A අසත්‍ය වේ

39) කුඩා රජ්‍ය රාශියක් එක්කොට ජර්මනිය යනුවෙන් රටක් බිහිකරන ලද්දේ

1. දෙවන විලියම් අධිරාජයා විසිනි
2. ඇඩොල්ෆ් හිට්ලර් විසිනි
4. වොන් වෝල්ක් විසිනි
4. ඔටෝවොන් බිස්මාකර් විසිනි

40) එක්සත් ජාතිනගේ සංවිධානයේ ප්‍රධාන පරිපාලන කායර්ාලය වූ මහලේකම් කායර්ාලය පිහිටා ඇත්තේ

1. ඇමරිකා එක්සත් ජනපදයේ නිව්යෝක් නුවර ය
2. නෙදර්ලන්තයේ හේග් නුවර ය
3. ඇමරිකා එක්සත් ජනපදයේ සැන්ෆැන්සිස්කෝ නුවර ය
4. ස්විස්ටලර්න්තයේ ජිනීවා නුවර ය



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources